සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2024
Second Term Test - Grade 08 - 2024

චිත්‍ර කලාව

කාලය පැය 03 යි

නම / විභාග අංකයඃ

I කොටස

- **සියලුම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.**
- **රූප සටහන ඇසුරින් ප්‍රශ්න අංක 01 - 05 දක්වා ප්‍රශ්නවල හිස්තැනට ගැලපෙන වචනය යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.**



01. යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් මෙම සිතුවම ..... නම් ලෙනෙහි ඇඳ තිබේ.
02. මෙම සිතුවම ඇඳ ඇති ලෙන ..... හි පිහිටා තිබේ.
03. මෙම ලෙනෙහි ඇඳ ඇති අඩි 17 ක් පමණ දිග ..... රූපය සුවිශේෂී නිර්මාණයකි.
04. සිතුවම් වර්ණ කිරීම සඳහා ස්වභාවික පරිසරයෙන් ලබා ගත් අමුද්‍රව්‍ය ..... සමඟ මිශ්‍ර කර තිබේ.
05. ..... ලෙන, යුරෝපයේ මෙම යුගයට අයත් සිතුවම් ඇඳ ඇති තවත් ස්ථානයක් ලෙස හැඳින්විය හැක.

- **අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

06. සම්ප්‍රදායික සැරසිලි මෝස්තරයක් වන අරිම්බුව අයත් වන්නේ,
    i. නිර්ජීවී ගනයටය ii. උද්භිද ගනයටය iii. දිව්‍ය ගනයටය iv. සත්ව ගනයටය
07. හිංදු කෝවිල් ආශ්‍රිතව පවත්වනු ලබන ශාන්තිකර්මය හඳුන්වන්නේ,
    i. කොහොඹා කංකාරිය ශාන්තිකර්මය ii. දෙවොල්මඩුව ශාන්තිකර්මය
    iii. පහන් මඩුව ශාන්තිකර්මය iv. කුම්බාභිෂේකම් ශාන්තිකර්මය
08. අනුරාධපුර යුගයට අයත් ජේතවනාරාම දාගැබ ඉදිකරවූයේ,
    i. දුටුගැමුණු රජුය ii. වලගම්බා රජුය iii. මහසෙන් රජුය iv. දේවානම්පියතිස්ස රජුය
09. ව්‍යාප්ත මෝස්තරයක් සඳහා වඩාත්ම සුදුසු මාතෘකාව වන්නේ,
    i. කුෂන් කවරයක් ii. සරම් වාටියක් iii. තෑගි දවටනයක් iv. මේස රෙද්දක්
10. ගෝපුර නම් වාස්තු විද්‍යාත්මක අංගය දක්නට ලැබෙන්නේ,
    i. හිංදු කෝවිල්වලය ii. ඉස්ලාම් පල්ලිවලය
    iii. ක්‍රිස්තියානි දේවස්ථානවලය iv. බෞද්ධ පන්සල්වලය

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (✓) හරි ලකුණ ද වැරදි නම් (✗) වැරදි ලකුණ ද යොදන්න.**

11. ඉවත දමන කඩදාසි අතින් ඉරා, නිර්මාණය කරනු ලබන චිත්‍ර කොලාජ් නම්වේ. ( )
12. අත් රූකඩ සහ නූල් රූකඩ, අතීතයේ සිට ලංකාවේ පැවත එන ජන කලාවකි. ( )
13. ගොතික් ක්‍රමයේ ක්‍රිස්තියානි දේවස්ථානවල, රවුම් හැඩයේ ආරුක්කු දැකිය හැකිය. ( )
14. අත් සකපෝරුව භාවිතයෙන්, ප්‍රමාණයෙන් විශාල මැටි භාණ්ඩ සකස් කර ගත හැකිය. ( )
15. හින්දු දේව ප්‍රතිමා වැඩ හිඳුවා ඇති හඳ්‍රාසනය, ඕවලාකාර හැඩයක් ගනී. ( )

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර A, B, C, D රූපසටහන් ඇසුරින් ලියන්න.**

A



B

C



D



E

16. A අක්ෂරයෙන් දැක්වෙන්නේ බුදුන්වහන්සේ බුද්ධත්වයට පත් වූ අවස්ථාව නිරූපණය කරන මුද්‍රාවයි. එම මුද්‍රාව නම් කරන්න. .....
17. B අක්ෂරයෙන් දැක්වෙන, බුදුන්වහන්සේ ධ්‍යානයකට සමවැදී සිටින ආකාරයට පෙන්වන මුද්‍රාව හඳුන්වන නම කුමක්ද? .....
18. C අක්ෂරයෙන් පෙන්වා ඇති, ධම්මචක්ක මුද්‍රාවෙන් නිරූපනය වන අවස්ථාව කුමක්ද? .....
19. කාන්තා දේව රූප සඳහා බහුලව භාවිතා කර ඇති, D අක්ෂරයෙන් පෙන්වා ඇති මුද්‍රාව නම් කරන්න .....
20. E අක්ෂරයන් දැක්වෙන කටක හස්ත මුද්‍රාව නිරූපිත, අනුරාධපුර යුගයට අයත් බුදු පිළිමයක් නම් කරන්න. .....

- **ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර ලියන්න.**

21. පන්ති කාමරයේදී, මූර්තියක් නිර්මාණය කිරීම සඳහා යොදාගත හැකි පහසුම මාධ්‍යය කුමක්ද?
.....
22. ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගුහා සිතුවම් අතර ඇති, ඇතා සහ ඇත්පැටවා සිතුවම දක්නට ඇත්තේ කොහේද?
.....
23. රතු වර්ණයට වඩාත්ම විසංගත වන වර්ණය කුමක්ද?
.....
24. චෛත්‍යයක හතරැස් කොටුවට ඉහළින් පිහිටා ඇති අංගය කුමන නමකින් හැඳින්වේද?
.....
25. බුදු පිළිමයක, වම් පාදය මත දකුණු පාදය තබා වැඩ හිඳින ආසන ක්‍රමය කුමන නමකින් හැඳින්වේද?
.....

- **පහත රූප සටහන හඳුනාගෙන අංක 26 - 30 දක්වා ප්‍රශ්නවලට ඒ ඇසුරින් පිළිතුරු සපයන්න.**



26. රූප සටහනින් දැක්වෙන ශාන්තිකර්මය කුමන නමකින් හැඳින්වේද?
.....
27. කුමන නර්තන සම්ප්‍රදායක් ඇසුරින් මෙම ශාන්තිකර්මය පැවැත්වේද?
.....
28. ප්‍රථම වරට මෙම ශාන්තිකර්මය පවත්වා ඇත්තේ කුමන ස්ථානයකද?
.....
29. මෙම ශාන්තිකර්මය පැවැත්වීමට හේතුවූ එක් අරමුණක් සඳහන් කරන්න.
.....
30. ශාන්ති කර්මයේ සැරසිලි සඳහා භාවිතා කරන අමුද්‍රව්‍යයක් නම් කරන්න.
..... (ල. 30)

II කොටස

- ★ පන්ති කාමරයේදී ඔබ අදින ලද බෝලය, පෙට්ටිය, වීදුරු බෝතලය ආදී ද්‍රව්‍ය පැන්සල භාවිතා කර කැමති පරිදි සම්පින්ඩනය කර අඳින්න.
- ★ ත්‍රිමාණ ලක්ෂණ පැන්සල භාවිතා කර යොදන්න.

(ලකුණු 20)

III කොටස

- **දී ඇති මාතෘකා වලින් එකක් තෝරා ගෙන වර්ණවත් චිත්‍රයක් අඳින්න.**

1. පෝයදින ගමේ පන්සල
2. ගං වතුර නිසා දුකට පත් වූ අය
3. වැව් ඉවුරට රැස් වූ අලි රංචුව
4. අඟල් 8 x 8 ප්‍රමාණයේ කුෂන් කවරයක්
5. ළමා කතන්දර පොතකට ගැලපෙන පිටකවරයක්
6. සත්ව රූප ඇසුරින් චිත්ත රෙද්දකට ව්‍යාප්ත මෝසතරයක්
7. පාසලේ පවත්වන විවිධ ප්‍රසංගය සඳහා නිර්මාණාත්මක දැන්වීමක්.

(ලකුණු 50)